# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2249/3 - 2021 ඔක්තෝබර් මස 11 වැනි සඳුදා - 2021.10.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය සහ 5 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

*උපලේඛනය*

| *I වන තීරය* | | | | *II වන තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 1 | 10.06 | 1006.30 | පාහින ලද හෝ ඔප දමන ලද හෝ නොලද සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කොටු සහල් | |
| | | 1006.30.10 | රළු සහල් (කැකුළු) | කි. ග්‍රෑමයට රු. 65 |
| | | 1006.30.20 | නාඩු සහල් (රතු හෝ සුදු) | කි. ග්‍රෑමයට රු. 65 |
| | | 1006.30.30 | සම්බා සහල් (රතු හෝ සුදු) | කි. ග්‍රෑමයට රු. 65 |

1A - PG 5424 — 495 (2021/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත උපලේඛනය මගින් දක්වා ඇති සහල් ආනයනය සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 65ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට ශත 25ක් අයකරගෙන, ඉතිරි වටිනාකම, වෙළඳ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයට යටත්ව, සී/ස රාජ්‍ය වානිජ (විවිධ) නීතිගත සංස්ථාව සඳහා අත්හරිනු ලැබිය යුතු බවට මම මෙයින් නියම කරනු ලැබේ.

3. මෙම නියමය 2021 ඔක්තෝබර් මස 12 වැනි දින සිට ආරම්භ වන මාස 04 ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**බැසිල් රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.